රග්බි ප්‍රවර්ධනයට යැයි පවසමින් ක්‍රිෂ් නමැති සමාගමකින් ලබාගත් රු. මිලියන 70ක් අයථා ලෙස පරිහරණය කළේය යන චෝදනාව මත පාර්ලිමේන්තු මන්ත්‍රී නාමල් රාජපක්ෂට එරෙහිව ඇති පැමිණිල්ලක් සම්බන්ධයෙන් කොටුව මහේස්ත්‍රාත් අධිකරණයට මැයි 25, 2022 දින මන්ත්‍රීවරයාව කැඳවූ බව රූපවාහිනී රාත්‍රී සිංහල ප්‍රධාන පුවත් කිහිපයක්ම වාර්තා කොට තිබුණි. එදිනම වාර්තා වූ තවත් පුවතක් වූයේ, පාස්කු ඉරුදින ප්‍රහාරය සම්බන්ධයෙන් අත්අඩංගුවේ පසුවූ මොහොමඩ් ඊබ්‍රාහිම් නමැති පුද්ගලයෙකු ඊයේ (මැයි 25, 2022) දින ඇප මත මුදා හැරි බවයි.

එහිදී නිරීක්ෂණය කළ හැකි වූයේ, ස්වාධීන රූපවාහිනී පුවත් සිරස්තලයෙහි, නාමල් රාජපක්ෂ සම්බන්ධ පුවතත්, මොහොමඩ් ඊබ්‍රාහිම් සම්බන්ධ පුවතත් එක් සිරස්තලයක් ලෙසින් වාර්තා කර තිබූ බවයි. එහි සඳහන් වූයේ, "මරාගෙන මැරුණු ඊබ්‍රහිම් පුතුන්ගේ පියාට ඇප ලැබෙද්දී,
මන්ත්‍රී නාමල් කොටුව උසාවියට" ලෙසයි.

මෙම පුවත් දෙකම වාර්තා කළ අනෙකුත් රූපවාහිනී රාත්‍රී සිංහල පුවත් විකාශයන් එම පුවත් වෙන් කොට වාර්තා කර තිබූ බවද නිරීක්ෂණය විය.

(මෙම දත්ත සඳහා පදනම් වී ඇත්තේ මැයි 25, 2022 රූපවාහිනී රාත්‍රී ප්‍රධාන සිංහල පුවත් විකාශනයන් පමණක් වේ. එදින වෙනත් වෙලාවන් තුළ විකාශනය වූ පුවත් තුළ ඊට වෙනස් දත්ත ඇතුළත් විය හැක.)